**20-12-2025** **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, සත්ගුරු පැමිණ සිටින්නේ ඔබගේ වාසනාව උතුම් කරවීමටයි. එමනිසා, ඔබගේ හැසිරීම් රටාව ඉතාමත්ම රාජකීය විය යුතුයි.

**ප්‍රශ්නය:** නාටකය තුළ නිර්මාණය වී ඇති කිසිම කෙනෙකුට දොස් පැවරිය නොහැකි සැලසුම කුමක්ද?

**පිළිතුර:** මෙම පැරණි ලෝකයේ විනාශය සඳහා වන සැලැස්ම නාටකය තුළම නිර්මාණය වී ඇත්තකි. කිසිම කෙනෙකුට ඒ පිළිබඳව දොස් පැවරිය නොහැක. මේ කාලයේදී මහාභූත සෑම එකක්ම විනාශය සඳහා දැඩි කෝපයකින් සිටියි. සෑම තැනකම භූමිකම්පා සිදු වේවි. ගොඩනැගිලි කඩා වැටේවි. ජලගැලීම් හා සාගත දුර්භික්ෂ ඇති වේවි. මෙන්න මේ නිසා තමයි පරමාත්ම පියා කියන්නේ: දරුවනි, දැන් ඔබගේ සිහිය මෙම පැරණි ලෝකයෙන් ඉවතට ගන්න. සත්ගුරුගේ ශ්‍රීමත් උපදේශ පිළිපදින්න. ජීවත්ව සිටිනා ගමන්ම ශරීර පිළිබඳ වූ අවධානය හලා දමා තමා ජීවාත්ම සත්ථාවක් බව සලකා පරමාත්ම පියාව සිහි කිරීමට නොනවත්වාම උත්සාහ දරන්න.

**ගීතය:** අප යන මාවතේ නොවැටී ඉදිරියට යාමට අප ප්‍රවේශම් විය යුතුයි.

ඕම් ශාන්ති. ඔබ අනුගමනය කළ යුත්තේ කුමන මාවතද? ඔබ යා යුත්තේ ගුරුගේ මාවතේයි. ඒ කුමන ගුරුද? ඉඳගෙන සිටිනා විටත්, ඇවිදින කරනා විටත් මිනිසුන්ගේ දෙතොලින් මතු වන වචන නම්: අහා ගුරුනි, ගුරුන් රැසක්ම සිටිනවා. අහා ගුරුනි කියා ඔබ කියන්නේ කාටද? ඔබ ගයන්නේ කාගේ ගුණද? එකම එක පරමාත්ම පියා පමණයි සත්ගුරු වන්නේ. භක්ති මාර්ගයේ ගුරුන් රැසක්ම සිටිනවා. එක් පිරිසක් එක් ගුරු කෙනෙකුගේ ගුණ ගයනා අතර තවත් පිරිසක් තවත් ගුරු කෙනෙකුගේ ගුණ ගයනවා. සැබෑම සත්ගුරු වන්නේ ප්‍රශංසාවට ලක් වන ඒකායන සත්‍යය කියා ඔය දරුවන්ගේ සිහියේ තිබෙනවා. සැබෑ සත්ගුරු සිටිනවා නම් බොරු අයත් සිටින්න ඕනේ. සැබෑම කෙනා සිටියේ සංගම යුගයේයි. භක්ති මාර්ගයේ දී පවා මිනිස්සු සත්‍යය කියා හඳුන්වන ඒකායනයේ ප්‍රශස්ත ගී ගයනවා. ඉහළම ඉහළ පරමාත්ම පියා පමණයි සත්‍යය වන්නේ ඒ ඔහුම පමණයි මුක්තිදායකයා හා මඟ පෙන්වන්නා වන්නේ. ගංගා වල ස්නානය කර වන්දනා ගමන් යාම සඳහා අද කාලයේ ගුරුන් මඟ පෙන්වන්නන් වෙනවා. සත්ගුරු එවන් කෙනෙක් නොවෙයි. සෑම කෙනෙක්ම මෙම සත්ගුරු සිහි කර අහෝ පාරිශුද්ධකරුවාණනි වැඩිනු මැනව කියා කන්නලව් කරනවා. සත්ගුරුට පමණයි පාරිශුද්ධකරු කියන්නේ. පාරිශුද්ධ කරවීම කළ හැක්කේ ඔහුට පමණයි. ඒ ගුරුන් කිසිම කෙනෙක්ව පාරිශුද්ධ කරවන්න බැහැ. නිරන්තරයෙන් මා පමණක්ම සිහි කරන්නැයි කියා ඔවුන්ට කියන්න බැහැ. මිනිස්සු ගීතාව හැදෑරුවත් එහි අර්ථය ඒ කිසිම කෙනෙකුට තේරෙන්නේ නැහැ. සත්ගුරු වන්නේ එකම එක ඒකායනය පමණක් බව ඔවුන්ට තේරුම් ගියා නම් ඔවුන් තම තමන්ව ගුරුන් කියා හඳුන්වා ගන්නා එකක් නැහැ. නාටකයට අනුව භක්ති මහෙහි දෙපාර්තමේන්තුව මුළුමනින්ම වෙනමම තිබෙන්නක්. ඒ මාවතේ ගුරුන් රැසකුත් බැතිමතුන් රැසකුත් සිටිනවා. මෙහි සිටින්නේ එකම එක අයෙක් පමණයි. මේ දේවතාවරුන් අංක එකේ සිටියා දැන් ඔවුන් අවසන්ම අංකය ඇති අය බවට පත් වෙලා. පරමාත්ම පියා පැමිණ ඔවුනට දෙව්ලොව ස්වාධිපත්‍යය ලබා දෙනවා. එමනිසා, අන් සෑම කෙනෙක්ම නිසැකවම නිවහන බලා ආපසු යා යුතුයි. මෙන්න මේ නිසා තමයි සැමටම මුක්තිය දානය කරන්නා එක් අයෙක් වන්නේ කියා කියන්නේ සෑම කල්පයකදීම සංගම් යුගයේදී දේවතා ධර්මය ස්ථාපනය කරනා බව ඔබ තේරුම් ගෙන සිටිනවා. ඔබලා ඉතාමත් උතුම් අය බවට පත් වෙනවා. ඔබ වෙන කිසිම දෙයක් කරන්නේ නැහැ. මුක්තිය හා ජීවන මුක්තිය දානය කරන්නේ එකම එක් අයෙක් බව ඔබට මතකයි. මෙය පරමාත්ම පියාගේම ගුණ වර්ණනාවයි. මුක්තිය හා ජීවන මුක්තිය ලබන්නේ සංගම් යුගයේදී පමණයි. ස්වර්ණමය යුගයේ ඇත්තේ එකම එක ධර්මයක් පමණයි. මෙයත් අවබෝධයට ගත යුතු කරුණකි. කෙසේවෙතත්, මෙම ප්‍රඥාව ඔබට දෙන්නේ කවුරුන්ද? මෙහි පැමිණ ඔබට මඟ පෙන්වන්නේ පරමාත්ම පියාම පමණක් බව ඔබ තේරුම් ගෙන සිටිනවා. ඔහු ශ්‍රීමත් දෙන්නේ කාටද? ජීවාත්ම සත්තාවන්ට. ඔහු පරමාත්ම පියා, ගුරුවරයා හා සත්ගුරු වෙනවා. ඔහු ඔබට ඥානය කියා දෙනවා. අන් සෑම ගුරු කෙනෙක්ම කියා දෙන්නේ භක්තිය පමණයි. ඔබ මෙම ඥානය තුලින් පරමාත්ම පියාගෙන් ජීවනමුක්තිය ලබා මෙම පැරණි ලෝකය අතහැර දමා යන්න යනවා. මෙයත් ඔබගේ අසීමිත

අත්හැරීමයි. ඔබගේ උපත් 84 චක්‍රය දැන් අවසන් වෙමින් පවතින බව පරමාත්ම පියා දැන් ඔබට පැහැදිලි කර කියා දී තිබෙනවා. මෙම ලෝකය දැන් අවසන් වීමට ලඟයි. කෙනෙක් තදින් රෝගාතුරව සිටිනා විට කියනවා: ඔහු මිය යාමටයි සිටින්නේ. ඉතින් ඔහුව සිහි කිරීමෙන් ඇති ඵලය කුමක්ද? ඒ ශරීරය විනාශ වී ගොස් ජීවාත්මය තවත් ශරීරයක් ගන්නවා. සෑම බලාපොරොත්තුවක්ම සිඳී යනවා. බෙංගාලයේ කෙනෙක් බලාපොරොත්තු රහිත තත්ත්වයකට පත් වුණු විට, ඔහුව ගංගා නදිය අසබඩට ගෙන යනවා. එවිට ඔහුට ඒ ගංතීරයේ සිට ශරීරය හලා යා හැකියි. දේවතා පිළිම වන්දනා කර ඔවුන් ගිල්වන්න. ගිල්වන්න කියා කියනවා. මුළු පැරණි ලෝකයම ගිලෙන්න ඇති බව ඔබලා දැන් තේරුම් ගෙන සිටිනවා. ජල ගැලීම්, ගිණිබත් වීම් ඇති වේවි. මිනිස්සු සාගතයේ මියැදේවි. මේ සෑම ආකාරයක දෙයක්ම සිදු වේවි. භූමි කම්පා වලින් ගොඩනැගිලි කඩා වැටේවි. මේ කාලයේ මහාභූත සිටින්නේ හොඳටම කෝප වෙලායි. ඔවුන් සියල්ලම විනාශ කර දමාවි. මුළු ලෝකයටම මෙම තත්ත්වය උදාවීමටයි යන්නේ. නොයෙකුත් ආකාරයේ මරණ සිදු වේවි. විෂ කැවූ බෝම්බ. ඒවායේ එක දුම් පොදක් හෝ ඇඟට ගියහොත් සිහි නැති වෙනවා. සිදු වීමට යන දේ ඔය දරුවන් දන්නවා. මේ සියල්ල කරවන්නේ කව්ද? පරමාත්ම පියා නොවෙයි. එය නාටකයේ නියමිත වූ දේවලුයි. කිසිම කෙනෙකුට දොස් පවරන්න බැහැ. මෙම සැලැස්ම නාටකයේ නිර්මානය වී ඇත්තක්. පැරණි ලෝකය අනිවාර්යෙන්ම නැවතත් අලුත් වේවි. ස්වභාවික ව්‍යසනත් සිදු වේවි. විනාශය සිදු විය යුතුයි. බුද්ධියේ යෝගාව මෙම පැරණි ලෝකයෙන් ඉවතට ගත යුතුයි. අසීමිත නිරාශාව කියන්නේ මෙයටයි. ඔබ දැන් අහා සත්ගුරු අහා කියා කියනවා. ඔබ අපට මෙම මාර්ගය පෙන්වා දී තිබෙනවා. ඔය දරුවන්ට කියා තිබෙනවා: ඔහුව අපහාසයට ලක් වන ආකාරයේ හැසිරීමක් තබා ගන්න එපා. ඔබ මෙහිදී ජීව මරණයක් ලද යුතුයි. ශරීරය අතහැර ඔබ තමන් ජීවාත්මයක් බව සලකනවා ඔබ ජීවාත්ම සත්තාවක් වී, ශරීරයෙන් මිදී, පරමාත්ම පියාව සිහිපත් කළ යුතුයි. ඔබ ඉතාමත් හොඳ දෙයක් කියනවා: අහා, සත්ගුරු අහා. පාරලෞකික සත්ගුරුට පමණයි ප්‍රශස්ත ගී ගයන්නේ. ලෞකික ගුරුන් රැසක් සිටිනවා. භක්ති මාර්ගයේ දීත් සිහි කරනා එකම එක සැබෑ සත්ගුරු කෙනෙක් පමණයි සිටින්නේ. මුළු ලෝකයේම පරමාත්ම පියා ඒකායන පියාම පමණයි. නව ලෝකය ස්ථාපනය වන්නේ කෙසේදැයි කියාවත් කිසිම කෙනෙක් දන්නේ නැහැ. ග්‍රන්ථ වල සියල්ල ශූන්‍ය වී ගොස් පසුව බෝ කොළයක් මත පාවී ශ්‍රී ක්‍රිෂ්ණා සම්ප්‍රාප්ත වෙනවා කියා සඳහන් කර තිබෙනවා. ඔහු බෝ කොළයක පාවී එන්න බැහැයි යන්න දැන් ඔබට තේරෙනවා. ක්‍රිෂ්ණාගේ ගුණ ගැයීමෙන් වැඩක් වෙන්නේ නැහැ. ඔබව ඉහළට ගෙන යාමට ඔබ දැන් සත්ගුරුව සොයා ගෙන සිටිනවා. ඉහළ යන අවධියේ දී සෑමට යහපත සැලසෙවා කියා සඳහන්ව තිබෙනවා. එමනිසා, ආධ්‍යාත්මික පියා මෙහි අසුන් ගෙන ජීවාත්ම සත්තාවන්ට කරුණු පහදා දෙනවා. උපත් 84 ක් ගෙන ඇත්තේ ජීව සත්තාවනුයි. සෑම උපතකදීම ඒ ජීවාත්මයන් විවිධ නම් හා ස්වරූප ලබනවා. අහවල් අහවල් කෙනා උපත් 84 ක් ගෙන තිබෙනවායි කියා ඔබට කියන්න බැහැ. නැහැ. උපත් 84 ක් ගන්නේ ජීවාත්ම සත්තාවයි: ශරීරය වෙනස් වෙනවා. මේ සියලුම කරුණු ඔබගේ සිහියේ තිබෙනවා. ඔබගේ බුද්ධියේ මෙම මුළු ඥානයම තිබිය යුතුයි. පැමිණෙන සෑම කෙනෙක්ටම මෙය පහදා දෙන්න. ආරම්භයේදී දේවතා රාජ්‍යය පමණක් පැවතුණු අතර මැදක් හරියේදී රාවන රාජ්‍යය ආරම්භ වුණා. ඔබ එන්න එන්නම පහළට ඇදගෙන වැටුණා. ස්වර්ණමය යුගයේ දී ඔබ සතෝ ප්‍රධාන්ව සිට පසුව එන්න එන්නම පහළට ඇද වැටෙමින් සතෝ, රජෝ හා තමෝ මට්ටම් වලට පැමිණියා. චක්‍රය දිගටම කැරකෙනවා. ඇතැම් අය අහනවා: බාබා අපව උපත් 84 චක්‍රයට ගෙන බාබාට සිදු වන්නේ කුමක්ද? කෙසේවෙතත්, මෙම ලෝක චක්‍රය සදාතනිකව නිර්මාණය වූවක්. එහි ආරම්භය, මධ්‍ය කාලය හා අවසානය ඔබ දැනගෙන සිටිය යුතුයි. මිනිසෙක් මෙය දැනගෙන සිටියේ නැතිනම් ඔහු අදේවවාදියෙකි. මෙය දැනගැනීමෙන් ඔබට එතරම්ම උසස් තත්ත්වයක් හිමි වෙනවා. මෙම අධ්‍යයනය ඉතාමත් ඉහළයි. ඉහළ තත්ත්වයක් දිනා ගැනීම සඳහා වැදගත් විභාගයකින් සමත් වන්නන් තම හදවතින් විශාල සතුටක් විඳිනවා. ලක්ෂ්මී හා නාරායන් තම තමන්ගේ පෙර උපතේ දී මෙම ඥානය හොඳින් ඉගෙන ගෙන සාමාන්‍ය මනුෂ්‍ය තත්ත්වයෙන් දේවතා තත්ත්වයට පත් වූවා. ඔවුන්ගේ රාජධානිය ස්ථාපනය වන්නේ මෙම අධ්‍යයනය මත පදනම්වයි. අධ්‍යයනය තුළින් එතරම් උසස් තත්ත්වයක් හිමි වෙනවා. හරිම අපූරුයි. ලොකු ලොකු පන්සල් සෑදූ අයගෙන් හා මහා උගතුන්ගෙන් අහන්න: ස්වර්ණමය යුගය ආරම්භයේදී ලක්ෂ්මී නාරායන උපත සිදු වූයේ කෙසේද කියලා. ඔවුන්ට උත්තර දිය නොහැකි වේවි. මෙය ගීතාවේ සඳහන් රාජයෝගාව බව ඔබලා දන්නවා. මිනිස්සු දිගටම ගීතාව හදාරනවා. නමුත් ඉන් ඔවුන් කිසිම ඵලයක් ලබා නැහැ. පරමාත්ම පියා දැන් මෙහි සිට ඔබලාට මෙය කියා දෙනවා. ඔබ කියනවා: බාබා අපි වසර 5000 කට පෙරත් මුණ ගැසුණා. ඇයි ඔබ ඔහුව මුණ ගැසුණේ? තම දෙව්ලොව උරුමය දිනා ගැනීමටත් ලක්ෂ්මී නාරායන් වගේ වීමටත්ය. මෙහි පැමිණෙන බාල, මහළු සෑම කෙනෙකුටම අනිවාර්යෙන්ම මෙය කියා දී තිබෙනවා. මෙය ඔබගේ අරමුණ හා

ඉලක්කයයි. මෙය සත්‍ය නාරායනගේ කතාන්දරයයි. රාජධානියක් බිහි වෙමින් පවතිනවාය යන්න ඔබට තේරෙනවා. මෙය හොඳින් තේරුම් ගන්නා අය ඇතුලාන්තයෙන් විශාල සතුටක් විඳිනවා. බාබා අහනවා: අධිරාජ්‍යයක් දිනා ගැනීමේ ධෛර්යය ඔබට තිබෙනවා ද? ඔවුන් කියනවා: ඔව් බාබා. ඇයි නැත්තේ? මිනිසුන් වන අප නාරායන වීමටයි ඉගෙන ගන්නේ. අපි මෙපමණ කාලයක් අප ශරීරයි කියා සැලකුවා. පරමාත්ම පියා දැන් අපට නිවැරදි මඟ පෙන්වා තිබෙනවා. ජීව අවධානයට පත්වීමට උත්සාහයක් අවශ්‍යයි. ඔබ නැවත නැවතත් නම හා රූපයේ පැටලෙනවා. පරමාත්ම පියා කියනවා: නම හා රූපයෙන් ඔබ මිදිය යුතුයි. ජීවාත්මය යන්නම නමක්. පරමාත්ම පියා උත්තරීතර ජීවයයි. උත්තරීතර පියායි. භෞතික පියෙකුට කවදාවත් උත්තරීතර පියායි කියන්නේ නැහැ. උත්තරීතර යන වචනය යොදන්නේ එකම එක පරමාත්ම පියාටම පමණයි. අහා ගුරුනි කියන්නේ ඔහුටයි. සික් ජාතිකයින්ටත් මෙය පැහැදිලි කර කියා දීමට ඔබට පුළුවනි. සික් ආගමේ ග්‍රන්ථයේ මේ පිළිබඳව පැහැදිලි විස්තරයක් තිබෙනවා. එම ජබ් සහීබ් හා සුක්මණී යන එම ග්‍රන්ථයේ තරම් වෙන කිසිම ග්‍රන්ථයක ඔහු ගැන එතරම් දෙයක් සඳහන් වී නැහැ. මෙම වචන දෙක පමණයි ඇත්තේ පරමාත්ම පියා කියනවා: සහීබ් සිහි කරන්න. උපත් 21 ක සතුටේ උරුමය ඔබට උරුම වනු ඇත. මේ සම්බන්ධයෙන් කිසිම පැටලැවිල්ලකට පත් විය යුත්තේ නැහැ. පරමාත්ම පියා සියල්ල හොඳින් පැහැදිලි කර ඔබට ඒ සියල්ල පහසු කරවනවා. හින්දුවරුන් රැසක් සීක් ධර්මයට මාරු වී සිටිනවා. මිනිසුන්ට මාර්ගය පෙන්වා දීමට ඔබ නොයෙකුත් වර්ගයේ පින්තූර ආදිය නිර්මාණය කරනවා. ඉතාමත් පහසුවෙන් පැහැදිලි කල හැකියි: ඔබ වෙනම ධර්මයකට ඇතුළු වුණු ජීවාත්මයකි. මෙය විවිධ ආගම් ගසයි. ක්‍රිස්තූන් වහන්සේ පැමිණියේ කෙසේදැයි කියා කිසිම කෙනෙක් දන්නේ නැහැ. අලුත්ම ජීවාත්මයකට කිසිම කර්ම වේදනාවක් විඳින්න නැති බව පරමාත්ම පියා පැහැදිලි කර කියා දී තිබෙනවා. දඬුවම් විඳීමට තරම් කිසිම පාප ක්‍රියාවක් ක්‍රිස්තු ජීවය විසින් කර නැහැ. එසේ පැමිණියේ සතෝප්‍රධාන් ජීවාත්මයකුයි. ඒ ජීව සත්තාව ඇතුලු වුණු කෙනාව තමයි කුරුසයේ ඇණ ගැසුවේ. ක්‍රිස්තූන්ව නොවෙයි. ඔහු පිට වී ගොස් වෙනත් උපතක් ගෙන උසස් තත්ත්වයක් දිනා ගත්තා. පෝප් තුමාගේ පින්තූරයකුත් තිබෙනවා. මේ කාලය වන විට මුලු ලෝකයම සැබවින්ම පැන්සයක් තරම්වත් නොවටිනා තැනක් බවට පත් වෙලා. ඔබත් සිටියේ එසේමයි. ඔබ දැන් පවුමක් තරම් වටිනා අය බවට පත් වෙනවා. ඔවුන්ගේ උරුමක්කරුවන්ට ඒවා මත ජීවත් විය හැකියි කියා දෙයක් නැහැ. එසේ සිදුවන්නේ නැහැ. ඔබ ඔබගේ අත්පුරවාගෙන ආපසු යාවි. අන් සෑම කෙනෙක්ම යන්නේ හිස් අතිනුයි. ඔබ ඉගෙන ගන්නේ සම්පූර්ණ වීමටයි. මීට පෙර කල්පයේදී පැමිණි අය නැවතත් වතාවක් පැමිණෙන බවත් ඔබ දන්නවා. ටිකකට හෝ ඇහුම් කන් දුන්නා නම් ඔවුන් පැමිණේවි. ඔබ සෑම කෙනෙක්ම එකම විටෙක පේන්න ඉන්නා එකක් නැහැ. ඔබලා පුරවැසියන් රැසක් නිර්මාණය කර ගන්නවා. බාබාට කිසිම කෙනෙක් දකින්න බැහැ. ටිකකට ඇහුම් කන් දුන්නත් ඔවුන් පුරවැසියන් නිර්මාණය වෙනවා. ඔබට ඔවුන්ව ගණන් කිරීමටවත් බැරි වේවි. ඔය දරුවන් දැන් සේවයේ නිරතව සිටිනා අතර බාබාත් නිරතව සිටින්නේ සේවයේයි. බාබාට සේවය නොකර ඉන්න බැහැ. ඔහු සෑම උදෑසනකම ඔබට සේවය කිරීමට පැමිණෙනවා. මිනිස්සු උදේ පාන්දරින් ආධ්‍යාත්මික සමූහ හා එක් වෙනවා. ඒ වෙලාවට සෑම කෙනෙක්ම නිදහස් බාබා කියනවා: ඔය දරුවන් ගොඩාක් උදේ පාන්දරින්ම ගෙවල් වලින් පිටමං වී නොපැමිණිය යුතුයි. ඒවගේම බොහෝ රෑ බෝවී යන්නත් හොඳ නැහැ. අද කාලේ දවසින් දවසම ලෝකය නරක අතටයි හැරෙන්නේ. මෙන්න මේ නිසා තමයි සෑම වීදියක් වීදියක් පාසාම මධ්‍යස්ථානයක් තිබිය යුත්තේ. එවිට ගෙයින් එළියට බැසූ සැනකින්ම මධ්‍යස්ථානයට යා හැකියි. ඔබගේ ගණන වැඩි වන විට අධිරාජ්‍යය ස්ථාපනය වී තිබේවි. පරමාත්ම පියා ඉතාමත් පහසුවෙන් පැහැදිලි කර කියා දෙනවා. රාජයෝගය මඟින් ස්ථාපනය සිදු වෙනවා. පසුව ඉතිරි ලෝකය පැවතෙන්නේ නැහැ. පුරවැසියන් රැසක් නිර්මාණය වෙමින් පවතිනවා. රෝසරියත් නිර්මාණය විය යුතුයි. ප්‍රධානම දෙය නම් බොහෝ දෙනෙකුට සේවය කර ඒ අයව තමා හා සම අය බවට පත් කළ අය රෝසරියේ ඇමිණෙන පබළු වේවි. මිනිස්සු රෝසරියක පබළු ගණිනවා. නමුත් එහි අරුත දන්නේ නැහැ. බොහෝ ගුරුන් තම අනුගාමිකයින්ට එවන් රෝසරියක් දෙනවා. එවිට ඔවුන්ගේ සිහිය ඒ වෙතම රඳවාගෙන තබා ගත හැකියි. ලොකුම සතුරා රාගයයි. දවසින් දවස, සෑම දෙයක්ම ඉතාමත් ප්‍රබල වේවි. මෙම ලෝකය ඉතාමත් අපිරිසිදු ලෝකයක් නිසා දවසින් දවස ජීවාත්මයන් තව තවත් තමෝප්‍රධාන් වෙමින් යනවා. බොහෝ අය බාබාට කියනවා: අපිට නම් දැන් එපා වෙලයි තිබෙන්නේ. දැන් ඉක්මනින්ම අපව ස්වර්ණමය යුගයට ගෙන යන්න. පරමාත්ම පියා කියනවා: ඉවසන්න. ස්ථාපනය සිදු වන බව සහතිකයි. ඔබ ව ගෙන යන්නේ මෙම සහතිකයයි. ඔය ජීවාත්මයන් පරම දනව්වේ සිට පැමිණ දැන් නැවතත් එහිම යායුතු බව ඔය දරුවන්ට කියා දී තිබෙනවා. පසුව ඔබලා තම චරිතය රඟපෑමට පහළට පැමිණේවි. එමනිසා, පරමදාමය සිහි කළ යුතුයි. පරමාත්ම පියා කියනවා: නිරතුරුවම මා පමණක් සිහි කරන්න. ඔබගේ පාප දුරු වී යාවි. සෑම කෙනෙකුටම

මෙම පණිවිඩය දෙන්න. වෙන පණිවිඩකරුවෙක් නැහැ. ඒ පූජකවරුන් මුක්ති දේශයෙන් ජීවයන් රැගෙන එනවා. පසුව ඔවුන් ඉණිමගේ පහළට පැමිණිය යුතුයි. ජීවාත්මයන් මුළුමනින්ම තමෝ ප්‍රධාන වුණු විට පරමාත්ම පියා පැමිණ ඒ සෑම කෙනෙක්වම සතෝප්‍රධාන් කරවනවා. සෑම කෙනෙක්ම නිවහන වෙත යා යුත්තේ ඔබ නිසායි: ඔබට නව ලෝකය අවශ්‍යයි නේද? මෙම නාටකය කල්තබාම තීරණය වූවකි. ඔය දරුවන් ඉතාමත් ඉහළින් කුල්මත්ව සිටිය යුතුයි. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. ඔබගේ ශරීරයේ නම හා රූපයෙන් මිදී ජීවාත්ම සිහියට පැමිණෙන්න. සත්ගුරුට අපහාස වන ආකාරයේ හැසිරීමක් කිසිම විටෙක තබා නොගන්න.
2. රෝසරියේ බීජයක් වීමට නම් බොහෝ දෙනෙක්ව තමා හා සම කරවීමට සේවය කරන්න. අධිරාජ්‍යයක් දිනා ගැනීමට තමන් ඉගෙන ගන්නවාය යන අභ්‍යන්තර සතුට රඳවා ගන්න. මෙම අධ්‍යයනය සාමාන්‍ය මනුෂ්‍යයෙකුගෙන් නාරායන වීමට ඇති දැනුමකුයි.

**වරදානය:** ඔබ සියලු නිධානයන් වලට අයිතියක් හිමිකර ගෙන, නිරන්තර සිහිපත් කිරීමෙන්, අවිනාශී ආදායමක් රැස් කරගනිත්වා.

නිරන්තර සිහිපත් කිරීමෙන්, ඔබ සෑම පියවරකදීම ආදායමක් උපයා ගන්නා අතර සතුට, සාමය, ආනන්දය සහ සෙනෙහස යන සියලු නිධානයන්ට අයිතියක් අත්විඳිනු ඇත. ඕනෑම වේදනාවක් වේදනාවක් ලෙස අත් නොවිඳිනවා ඇත. සංගම් යුගයේදී, බ්‍රහ්මින්වරුන්ට වේදනා විඳිය නොහැක. යම් දුක් වේදනාවක් තිබේ නම්, එය ඔබට පියාව සිහිපත් කිරීමටයි පැමිණෙන්නේ. රෝස මලකට තමාව ආරක්ෂා කර ගැනීමට කටු ඇති සේම, ඒ ආකාරයෙන්ම, ඕනෑම දුෂ්කරතාවයක් ඔබට පියා ගැන තවදුරටත් මතකයට නැංවීමට උපකාරී වේ.

**පාඨය:** ඔබ සෙනෙහසේ ස්වරූපය පිළිබඳ ඔබේ අත්දැකීම පවසයි, දැන් ඔබේ බලය පිළිබඳ අත්දැකීම පවසන්න.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: දැන් සම්පූර්ණ හා කර්මතීත් වීමේ ගැඹුරු සැලකිල්ල ඇති කරගන්න.**

අවසාන කර්මතීත් අවධියේ චරිත කොටස ආශිර්වාද ලබා දීම පමණක් බව ඔබ සකාර් ස්වරූපයෙන් දුටුවා. එය සමබරතාවයක් පවත්වා ගැනීමේ විශේෂත්වය සහ ආශිර්වාද ලබා දීමේ ආශ්චර්යය විය. බ්‍රහ්ම බාබාව එලෙසම අනුගමනය කරන්න. මෙය පහසු සහ බලවත් සේවයයි. විශේෂ ජීවාත්මයන්ගේ චරිත කොටස දැන් ආශිර්වාද පිරිනැමීමයි, ඔබ ඔවුන්ට ඇස් හරහා හෝ නළලේ ඇති මැණික හරහා ලබා දෙන්න.